

(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(8).]

පාර්ලිමේන්තුවේ අංක 4 දරන
න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2026 ඔක්තෝබර් 09 සිකුරාදා

2026 ඔක්තෝබර් 20 අඟහරුවාදා

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව,— ව්‍යාපාර ධාරිතාව ඉහළ නැංවීම, මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම, තාක්ෂණයට අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'SDP' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම මඟින් කෘෂිකාර්මික හා කෘෂි ව්‍යාපාරික අංශ ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'AVC' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

එකී 'SDP' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) ප්‍රතිපත්ති පාදක ණයක් (Policy-Based Loan - PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) මූල්‍ය අතරමැදි ණයක් (Financial Intermediation Loan - FIL) ද, එකී 'AVC' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන තිහක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ප්‍රතිපත්ති පාදක ණයක් (PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70) මූල්‍ය අතරමැදි ණයක් (FIL) ද ඇතුළත් මූල්‍ය සහාය සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇති හෙයින් ද;

‘SDP’ වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, ‘AVC’ වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, අවශ්‍ය නිසි විමර්ශනයන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හඳුනාගනු ලබන මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ණය වශයෙන් ලබා දීමට අපේක්ෂා කරන බැවින් ද, එම මූල්‍ය ආයතන එම අරමුදල් නිකුත් කිරීමේ දී මූල්‍ය අතරමැදියන් ලෙස කටයුතු කරනු ලබන හෙයින් ද;

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 39 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ව්‍යවසායයක් නොවන යම් ආයතනයක බැඳීම්වලට අදාළව අරමුදල් ණය වශයෙන් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වන හෙයින් ද;

ඊට අනුකූලව, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය සහ 39 වගන්තිය ප්‍රකාරව, අවශ්‍ය නිසි විමර්ශනයන්ගෙන් අනතුරුව පහත සඳහන් රාජ්‍ය බැංකු හරහා, ‘ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන’ (‘SDP’) සහ ‘කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන’ (‘AVC’) යන වැඩසටහන්වලට අදාළව සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය වැඩසටහන් යටතේ මූල්‍ය අතරමැදි ණය ලබා දීමට අවශ්‍ය අරමුදල් ලබා දීම අනුමත කළ යුතු බවටත්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සහ අනෙකුත් අදාළ ලිඛිත නීතිවල විධිවිධානවලට අනුකූලව, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට බලය පැවරිය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. මහජන බැංකුව;
2. ලංකා බැංකුව;
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව;
4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව; සහ
5. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1981 අංක 68 දරන කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2023),— 1981 අංක 68 දරන කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ 2025.10.21 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

2026 ඔක්තෝබර් 21 බදාදා

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 ඔක්තෝබර් 21 බදාදා)

2329/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වගන්තියට අදාළව සංශෝධනයක් ගෙන ඒම සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස කමිටුවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටුව පත්කරන ලද දිනය සහ කමිටුවේ නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම වගන්තියට අදාළ සංශෝධන අනුමැතිය සඳහා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන කාලරාමුව කවරේද;

(iii) මෙම වගන්තිය සංශෝධනය නොකිරීමට තීරණය කර තිබේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2357/2026

ගරු සුරංග රත්නායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2026 අප්‍රේල් මාසයේදී 'අස්වැසුම' දත්ත පද්ධතියේ මතුවූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් සිදුවූ ද්විත්ව ගෙවීම් යටතේ ගෙවා ඇති මුදල සහ එලෙස ගෙවීම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට අයකරගෙන ඇති මුදල කොපමණද;

(iii) ඉතිරි මුදල අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම තාක්ෂණික දෝෂය සඳහා වගකිව යුතු පාර්ශ්ව හඳුනාගැනීම සඳහා විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමන කවරේද;

(iii) අස්වැසුම දත්ත පද්ධතිය සහ ගෙවීම් පද්ධතිය පිළිබඳ ස්වාධීන තොරතුරු තාක්ෂණ විගණනයක් සිදු කිරීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, එම විගණනය සිදු කරන ලද දිනය සහ ආයතනය කවරේද;

(v) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2358/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2026 ජූලි 31 දින වනවිට 'අස්වැසුම' සුබසාධක ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයදුම්කරුවන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සම්පූර්ණ කළ පවුල් සංඛ්‍යාව සහ එය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභ අහිමිවූ පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දෙවන අදියරේ සුදුසුකම්ලාභී නාම ලේඛන සම්බන්ධයෙන් ලැබී ඇති අභියාචනා හා විරෝධතා සංඛ්‍යාව, ඉන් විභාග කර අවසන් කර ඇති සංඛ්‍යාව සහ මුල් තීරණය සංශෝධනයවූ අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දෝෂ සහිත දත්ත හේතුවෙන් සුදුසුකම් නොලබන පවුල් ප්‍රතිලාභ ලබා ඇති සහ සුදුසුකම් සහිත පවුල් සඳහා ප්‍රතිලාභ අහිමිවූ බවට හඳුනාගෙන ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(v) සුදුසුකම් නොලැබූ පවුල් සඳහා ප්‍රතිලාභ ලබාදීම හේතුවෙන් සිදුවී ඇති රාජ්‍ය මූල්‍ය පාඩුව කොපමණද;

(vi) වත්මන් නිර්ණායක සංශෝධනය කර නව නිර්ණායක යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා)

2335/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආයුර්වේද රෝහල්වල නේවාසික රෝගීන් සඳහා වෙන් කර ඇති ඇඳන් සංඛ්‍යාව;

(ii) 2025 වර්ෂය තුළ එම රෝහල්වලින් ප්‍රතිකාර ලබාගත් බාහිර සහ නේවාසික රෝගීන් සංඛ්‍යාව;

(iii) එම වර්ෂය තුළ රාජගිරිය ආයුර්වේද රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් මුළු රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද වෛද්‍ය උපාධිය ලබාගන්නා උපාධිධාරියෙකුට රජයේ රැකියාවක් ලබාදීමට රජය බැඳී සිටින්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) මේ වනවිට රැකියා විරහිත ආයුර්වේද උපාධිධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2336/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ සාමාජිකයන් කවුරුන්ද;

(ii) එහි ව්‍යවස්ථාපිත වගකීම කවරේද;

(iii) කොමිෂන් සභාවේ කටයුතු සඳහා 2025-2026 මුදල් වර්ෂය සඳහා රජය විසින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2026 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් ඉටු කර ඇති කාර්යයන් කවරේද;

(ii) පසුගිය වර්ෂ 02ක කාලය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2337/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද ශල්‍යවේදී උපාධිය හිමි වෛද්‍යවරුන් සිටියද, රජයේ ආයුර්වේද රෝහල්වල පිළිගත් ශල්‍යකර්ම සිදු නොකරන බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජගිරිය ආයුර්වේද රෝහලේ මේ වනවිට දරු උපත් සිදු කරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එම රෝහලේ අවසන් වරට දරු උපතක් සිදු කර ඇති දිනය කවරේද;

(iii) එම රෝහලේ නොමේරූ ළදරු ප්‍රතිකාර ඒකකයක් තිබේද;

(iv) මේ වනවිට දරු උපත් සිදු නොකරන්නේ නම්, එම ඒකකය පවත්වාගෙන යාමේ අවශ්‍යතාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආයුර්වේද රෝහල්වල හෘද රෝග, අධි රුධිර පීඩනය, පිළිස්සුම්, උණ්ඩුකපුච්ඡ ප්‍රදාහය, පිළිකා, සර්ප විෂ හා වස විෂ වර්ග ශරීරගතවීම් සහ වෙනත් හදිසි රෝගී තත්ත්වයන් සඳහා භාවිත කළ හැකි හදිසි ඖෂධ ප්‍රතිකාර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 ඔක්තෝබර් 23 සිකුරාදා)

2390/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රම වාසනා අරමුදල 2026.06.30 දිනය වනවිට විසුරුවා හැර ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම අරමුදල විසුරුවා හැරීමට හේතු සහ රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන කමිටුව විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේද;

(iii) අරමුදල විසුරුවා ඇවර කිරීම සඳහා පත් කර ඇති ඇවරකරුගේ හෝ ඇවරකරුවන්ගේ නම්, තනතුරු සහ ඔවුන්ට පැවරී ඇති වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) අරමුදල ඇවර කිරීමේ වත්මන් ප්‍රගතිය, ඒ සඳහා සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2391/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ඇවර කරන දිනය වනවිට එහි බැංකු ගිණුම්, ස්ථාවර තැන්පතු, වංචල හා නිශ්චල දේපළ, ලැබිය යුතු මුදල් සහ ගෙවිය යුතු බැරකම්වල වටිනාකම, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අරමුදල ඇවර කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් හා දේපළ පවරා දෙනු ලබන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ආයතනය කවරේද;

(iii) එලෙස පවරා දෙනු ලබන මුදල් හා දේපළ කම්කරු සුබසාධන කටයුතු සඳහා පමණක් භාවිත කිරීම සහතික කිරීම පිණිස ගනු ලබන නීතිමය සහ මූල්‍යමය ක්‍රියාමාර්ග කවරේද;

(iv) අරමුදලේ අවසන් ගිණුම් සහ ඇවරකරුගේ වාර්තාව විගණකාධිපතිවරයාගේ විගණනයට යොමු කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2392/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' විසුරුවා හරින ලද දිනය වනවිට වෛද්‍ය ආධාර, නීති ආධාර, ශිෂ්‍යත්ව, මරණාධාර, ආපදා සහන, වෘත්තීය පුහුණුව හා අනෙකුත් ආධාර සඳහා ඉතිරිව තිබූ අයදුම්පත් සංඛ්‍යාව, ආධාර වර්ගය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම පවරා දෙන ආයතනය කවරේද;

(iii) මේ වනවිටත් අයදුම් කර ඇති පුද්ගලයන්ගේ අයදුම් දිනය සහ ප්‍රමුඛතා අනුපිළිවෙළ ආරක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2021 සිට 2026 දක්වා කාලය තුළ —

(i) අරමුදල සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් අනුමත කළ, ප්‍රතික්ෂේප කළ හා ගෙවීමට ඉතිරිව ඇති අයදුම්පත් සංඛ්‍යාව;

(iii) ප්‍රතිලාභීන්ට ලබාදී ඇති මුළු මූල්‍ය ආධාර ප්‍රමාණය;

වර්ෂය, දිස්ත්‍රික්කය සහ ආධාර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කාලසීමාව තුළ උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වලින් ලැබුණු අයදුම්පත් සහ ප්‍රදානය කළ ප්‍රතිලාභ සංඛ්‍යාව, ජාතික මට්ටමින් ලැබුණු හා ප්‍රදානය කළ මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 03 අඟහරුවාදා)

2452/2026

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2020.01.01 දින සිට 2026.06.30 දින දක්වා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන මඟින් විදේශීය ණය හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කළ හෝ ක්‍රියාත්මක කරනු ලබන එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් —

(i) ව්‍යාපෘතියේ නම හා ණය ලබාදෙනු ලබන ආයතනයේ ව්‍යාපෘති අංකය;

(ii) අරමුදල් සපයන විදේශීය ආයතනය හෝ රාජ්‍යය;

(iii) අදාළ ගිවිසුම් අංක, අත්සන් කළ දින හා ක්‍රියාත්මකවූ දිනයන්;

(iv) මුළු පිරිවැය, විදේශීය අරමුදල් ප්‍රමාණය හා රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය;

(v) අදාළ පොලී අනුපාතය, සහන කාලය හා ආපසු ගෙවීමේ කාලය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2026 ජූනි 30 දිනට එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් —

(i) වෙන් කළ මුදලින් වියදම් කර ඇති මුදල හා එහි ප්‍රතිශතය;

(ii) භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන්;

(iii) මුල් සැලසුමට අනුව අපේක්ෂිත ප්‍රගතිය සහ සැබෑ ප්‍රගතිය අතර වෙනස;

(iv) සිදුවී ඇති ප්‍රමාදය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2453/2026

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නිකුත් කළ පෙළ පොත් සහ විෂය මොඩියුල මුද්‍රණය සඳහා විදේශීය අරමුදල් යොදාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ නම සහ අරමුදල් සපයන ආයතනය හෝ රාජ්‍යය කවරේද;

(iii) එම අරමුදල් ණයක් හෝ ප්‍රදානයක් ලෙස ලබාගෙන තිබේද;

(iv) ව්‍යාපෘති කාලසීමාව සහ මුද්‍රණය සඳහා වෙන් කළ මුළු අරමුදල් ප්‍රමාණය කවරේද;

(v) 2026.06.30 දිනට එයින් වියදම් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෝෂ හේතුවෙන් බෙදාහැරීම නවතා දැමීමට හෝ ඉවත් කිරීමට සිදුවූ පිටපත් සංඛ්‍යාව ශ්‍රේණිය, විෂය සහ මාධ්‍ය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එමඟින් රජයට සිදුවූ මූල්‍ය අලාභය කොපමණද;

(iii) නැවත මුද්‍රණය කළ පිටපත් සංඛ්‍යාව, ඒ සඳහා වැයවූ මුදල සහ එම මුදල් ලබාගත් මූලාශ්‍රය කවරේද;

(iv) මේ සම්බන්ධයෙන් පවත්වන ලද විර්මශනවල නිගමන කවරේද;

(v) වගකිවයුතු පාර්ශ්ව වෙතින් එම අලාභය අයකර ගැනීමට පියවර ගෙන තිබේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2454/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ සඳහා වෙන් කල මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඉදිකිරීම් භාර දුන් කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(vi) එම කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා දරන ලද වියදම සහ භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) ඇස්තමේන්තුගත මුදල ඉක්මවා වියදම් කර තිබේ නම්, එම ප්‍රමාණය සහ එයට හේතු කවරේද;

(iii) 2026 වර්ෂය සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන සහ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට නියමිත දිනය කවරේද;

(iv) වාර්ෂික නඩත්තු හා මෙහෙයුම් පිරිවැය ලෙස ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 04 බදාදා)

2455/2026

ගරු කිංස් නෙල්සන් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය සිදු කරනු ලබන ආකාරය කවරේද;

(iii) 2026 වර්ෂය සඳහා වැටුප් හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහා සහ සවිබලගැන්වීම් වැඩසටහන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සවිබලගැන්වූ පවුලක් ‘දරිද්‍රතාවයෙන් මිදුණු පවුලක්’ ලෙස හඳුනාගැනීම සඳහා භාවිතා කරන නිර්ණායක හෝ මිනුම් දර්ශක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 05 බ්‍රහස්පතින්දා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

34/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ භාරකාර අරමුදල පිහිටුවීමේ අරමුණු;

(ii) එම අරමුදල සඳහා මුදල් ලැබෙන මූලාශ්‍ර;

(iii) අරමුදලේ වත්කම් උපයෝගී කරගනිමින් රජය විසින් දේපළ මිලදී ගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

(iv) එම දේපළ හෝ ආයෝජන මඟින් අරමුදලේ මූල්‍යමය ශක්තිය සහ ආදායම් තත්ත්වය වර්ධනයවී තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් අර්ජුන මහේන්ද්‍රන් යන අයට චෝදනා එල්ලවූ වර්ෂය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව මෙරට අධිකරණ මඟින් නිකුත් කර ඇති නොතීසි සංඛ්‍යාව කොපමණද;

(iii) එම නොතීසි නිකුත් කළ දින සහ ඒවා නිකුත් කරන ලද අධිකරණවල නම් කවරේද;

(iv) මෙතෙක් ඔහු මෙරටට ගෙන්වා ගැනීමට නොහැකි වීමට බලපා ඇති හේතු කවරේද;

(v) ඔහු මෙරටට ගෙන්වා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

688/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අයදුම්පත් අතරින් ක්‍රියාමාර්ග ගෙන ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මේ වනවිට එක්රැස්වී ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අයදුම්පත් නිසි පරිදි ඇගයීමට ලක් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

989/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ ශ්‍රමිකයන් සඳහා විදාහුත් වාහන ආනයනය කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) ඒ යටතේ මෙරටට ආනයනය කර ඇති විදාහුත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) වැඩසටහන සඳහා අනුගමනය කළ සුදුසුකම් ලැබීමේ නිර්ණායක කවරේද;

(iv) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අක්‍රමිකතා හෝ දූෂණ සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/2026

ගරු ඥානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි ජනනයෙන් එක් එක් විදුලි ජනන ක්‍රමයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩි පිරිවැයක් සහ අවම පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කවරේද;

(iii) වැඩි පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කෙරෙහි ඇති නැඹුරුතාවය අවම කිරීම සඳහා සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ සිට මේ දක්වා සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධනය කළ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් ගෘහස්ථ පාරිභෝගිකයන්ට දැරීමට සිදුවූ අමතර ගාස්තුව සාමාන්‍යයක් ලෙස කොපමණද;

(iii) අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2327/2026

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතරින් සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී සහ සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 වර්ෂයේදී මෙරටට ආනයනය කරන ලද මෙට්‍රෝ බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ධාවනය වන පෞද්ගලික බස් රථ සංඛ්‍යාව පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් බලපත්‍ර නිකුත් කර ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) බලපත්‍ර නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් මඟින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වාර්ෂිකව ලබන ආදායම දළ වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2354/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ආරම්භ කළ දින සිට මේ දක්වා වාර්ෂිකව සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදන, වැය කළ මුදල සහ සිදු කළ කාර්යයන්, භාවිතයට නොගත් ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අබලන් තත්ත්වයට පත්වී ඇති සිසු නේවාසිකාගාර, විද්‍යාපීඨ ගොඩනැගිලි සහ පරිහානියට පත්වී ඇති ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) නොඑසේ නම්, ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) අමාත්‍යාංශයේ නිලධාරින් මෑතකදී විද්‍යාපීඨය නිරීක්ෂණය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී නිරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) ඉහත සඳහන් ගැටලු නිරාකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2403/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හබරණ, මින්නේරිය සහ කවුඩුල්ල ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රියාත්මක වන උද්‍යාන සහ ඒවා පාලනය කරනු ලබන ආයතන කවරේද;

(ii) 2026 වර්ෂයේ මේ දක්වා එම උද්‍යාන නැරඹූ දේශීය සහ විදේශීය සංචාරකයන් සංඛ්‍යාව සහ ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මින්නේරිය ජාතික වනෝද්‍යානයට පැමිණෙන දේශීය සහ විදේශීය සංචාරකයින් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ සහ සංචාරකයන් උද්‍යානයට ඇතුළත් කිරීමේ ක්‍රමවේදයේ දුර්වලතා පවතින බව පිළිගන්නේද;

(iii) එම වනෝද්‍යානය තුළ ඇති සත්ව කෞතුකාගාරය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) දෛනිකව පැමිණෙන සංචාරකයන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් තිබේද;

(vi) එසේ නම්, පවතින වැසිකිළි හා කැසිකිළි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2471/2026

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගත කර සිටින සැකකරුවන්, දඬුවම් ලබන රැඳවියන් සහ මරණ දණ්ඩනය නියමවූ රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රැඳවියන්ගේ ආහාරපාන සහ අනෙකුත් පහසුකම් සඳහා දිනකට වැය කරන මුදල කොපමණද;

(iii) සුළු වැරදි සඳහා රක්ෂිත බන්ධනාගාරගත කර සිටින පුද්ගලයන් සඳහා ඇප කොන්දේසි ලිහිල් කිරීම හෝ විකල්ප දඬුවම් ක්‍රම හඳුන්වා දීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) බන්ධනාගාර නිලධාරීන්ගේ ආරක්ෂාව, සේවා පහසුකම් සහ වෘත්තීය ගැටලු විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) රැඳවියන්ගේ සෞඛ්‍ය, සනීපාරක්ෂාව සහ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමට වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද;

(iv) රැඳවියන් පුනරුත්ථාපනය කිරීම සහ සමාජගත කිරීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2506/2026

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අස්වනු කළමනාකරණය සඳහා නිසි ආර්ථික මධ්‍යස්ථානයක් නොමැති වීම හේතුවෙන් ගොවීන් සහ ධීවරයන්ට සිදුවන ආර්ථික පාඩුව පිළිබඳ අමාත්‍යාංශය සතුව දත්ත වාර්තා පවතින්නේද;

(ii) බහුල වශයෙන් අස්වනු ලැබෙන කාලවලදී මෙම ප්‍රදේශවල ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් ආහාර නාස්තිය සිදුවන බවත්, එය ජාතික ආහාර සුරක්ෂිතතාවයට සෘජුවම බලපාන බවත් පිළිගන්නේද;

(iii) පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍රකර ගනිමින් නවීන පහසුකම් සහිත ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි ආර්ථික මධ්‍යස්ථානයක් මඟින් අස්වනු නාස්තිය අවම කිරීමට සහ අතිරික්ත අස්වනු අගය එකතු කළ නිෂ්පාදන බවට පත් කිරීමට ඇති සැලසුම් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය සහ ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 06 සිකුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

202/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා දුම්රියේ ගැටී මිය ගිය අලි ඇතුන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු සිදුවූ ස්ථාන කවරේද;

(iii) දුම්රියේ ගැටී අලි ඇතුන් මිය යෑම වැළැක්වීම සඳහා තිරසර විසඳුමක් ලබාදීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

373/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර බන්ධනාගාරයේ මේ වනවිට රඳවා සිටින රිමාන්ඩ් සිරකරුවන් සංඛ්‍යාව සහ වරදකරුවන්වූ සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරයේ රඳවා තැබිය හැකි අනුමත සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) බන්ධනාගාරය තුළ අනුමත ධාරිතාව ඉක්මවා සිරකරුවන් රඳවා ඇති බව පිළිගන්නේද;

(iv) බන්ධනාගාරය තුළ බරපතළ අපිරිසිදු තත්ත්වයක් පවතින බව පිළිගන්නේද;

(v) එම බන්ධනාගාරය සෞඛ්‍යාරක්ෂිත සහ පිරිසිදු ස්ථානයක් බවට පත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

477/2025

ගරු රවී කරුණානායක මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් මෙහෙයවනු ලබන සමස්ත ගුවන් යානා සංචිතයේ ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානා බදු පදනම මත ලබාගෙන ඇති කොන්දේසි සහ නියමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එහි සිටින ස්ථිර සහ අනියම් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂ 05 තුළ කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද මුළු වැටුප් සහ දීමනා එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්තමානයේ එක් ගුවන් යානයක් සඳහා සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩල සංඛ්‍යාව සහ එම අනුපාතය කලාපයේ අනෙකුත් ප්‍රමුඛ පෙළේ ගුවන් සේවා සමාගම් සමඟ සැසඳූ විට කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකන් ගුවන් සේවයේ අනුබද්ධ සමාගම් කවරේද;

(ii) එම එක් එක් අනුබද්ධ සමාගම සංස්ථාපනය කරන ලද දින කවරේද;

(iii) එම ආයතන විසින් ඉදිරියට ගෙන එනු ලබන සමුච්චිත ලාභය හෝ අලාභය, එක් එක් අස්ථිත්වය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අනුබද්ධ සමාගම්වල මුළු පිරිවැටුම, දළ ලාභය, ශුද්ධ ලාභය, ආයෝජන ප්‍රතිලාභය, සෘජු බදු සහ ශුද්ධ ශේෂපත්‍ර අගය පසුගිය වර්ෂ 05 සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

906/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, මේ වනවිට ලියාපදිංචි කර ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල සේවයේ නියුතු පාලිකාවන් සපුරාලිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම කවරේද;

(iii) මේ වනවිට සේවයේ නියුතු පෙර පාසල් පාලිකාවන් අතරින් අවම අධ්‍යාපන සුදුසුකම සපුරා ඇති පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) සෑම පෙර පාසලක් සඳහාම එකම විෂය නිර්දේශයක් හෝ ඒ හා සමාන මාර්ගෝපදේශන ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේද;

(v) පෙර පාසල්වල පාලිකාවන්ට රජයෙන් ස්ථිර වැටුපක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

920/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 පෙබරවාරි මාසයේ ඉන්දියාවේ පැවති 'බිම්ස්ටෙක් තරුණ සමුළුව' සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගිවූ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) එම සාමාජිකයන්ගේ නම් සහ තනතුරු කවරේද;

(iii) සමුළුව පැවති කාලසීමාව කොපමණද;

(iv) එම කණ්ඩායම ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සහ නැවත පැමිණි දිනයන් කවරේද;

(v) මෙම සමුළුව පැවැත්වීමේ අරමුණු කවරේද;

(vi) එම සමුළුව සඳහා සහභාගිවූ ශ්‍රී ලාංකික කණ්ඩායම වෙනුවෙන් රජය විසින් වැය කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(vii) එම මුදල වැයවූ ආකාරය විස්තරාත්මකව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1157/2025

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශය වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාරගත් බව අදාළ ඉල්ලුම්කරුට ලිඛිතව හෝ වෙනත් ක්‍රමයකින් දැනුම්දීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) ඉල්ලා සිටින තොරතුරු එම පනතින් නියම කර ඇති කාලසීමාව තුළ ලබාදීමට පියවර ගෙන තිබේද;

(iii) ඉල්ලා සිටින තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලබාදෙන තොරතුරු සඳහා ගාස්තුවක් අය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගාස්තු අයකිරීමේ පදනම හා ක්‍රමවේදය කවරේද;

(iii) එම ගාස්තු ගෙවිය යුතු අවස්ථාව කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1670/2025

ගරු වාමර සම්පත් දසනායක මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සියලු බන්ධනාගාරවල රඳවා තැබිය හැකි උපරිම සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට බන්ධනාගාරවල රඳවා සිටින මුළු සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බන්ධනාගාරවල පවතින තදබදය අවම කිරීම සඳහා රජය විසින් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබන කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධිකරණ නඩු විභාගයකින් අනතුරුව වරදකරුවන් බවට පත්වී දඬුවම් නියම කරන ලද සිරකරුවන් අතරින්, රක්ෂිත බන්ධනාගාරගතව සිටි කාලය තුළදී ඉහළ අධිකරණ වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මඟින් රක්ෂිත බන්ධනාගාරගත කාලය, දඬුවම් කාලයට ගණනය කිරීම සම්බන්ධයෙන් ලබාදී ඇති සහනය 2024 මැයි මස 03 දින සිට ක්‍රියාත්මක වන බැවින්, එම දිනයට පෙර එම සහනය ලැබීමට සුදුසුකම් ලැබූ සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1983/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදපෙරදිග අර්බුදය හේතුවෙන් නාවික රක්ෂණ ගාස්තු 20%කින් පමණ ඉහළ යාම සහ රතු මුහුදේ ප්‍රවාහන අවහිරතා නිසා ශ්‍රී ලංකා තේ අපනයනකරුවන් මුහුණ දෙන ආර්ථික පිරිවැය කළමනාකරණයට අමාත්‍යාංශය මැදිහත් වන්නේද;

(ii) 'තෙල් සඳහා තේ' ණය ක්‍රමය අවසන් වීමත් සමඟ, ඉරානය වැනි ප්‍රධාන ගැනුම්කරුවන් වෙත තේ අලෙවි කිරීමේදී මතුව ඇති ගෙවීම් ගැටලු විසඳීමට හඳුන්වාදී ඇති විකල්ප බැංකු ක්‍රමවේද කවරේද;

(iii) තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය රුපියල් 1,000 ඉක්මවා යාම හමුවේ, වෙන්දේසි මිලෙහි ඇතිවන අස්ථාවරත්වයෙන් කුඩා තේ වතුහිමියන් ආරක්ෂා කිරීමට යෝජිත සහන පොලී ණය ක්‍රමය ක්‍රියාත්මක කරන දිනය කවරේද;

(iv) මැදපෙරදිග වෙළඳපොළ අවදානම අවම කිරීමට, චීනය සහ රුසියාව හා පැරණි සෝවියට් කලාපයේ රටවල් (CIS රටවල්) ඉලක්ක කරගත් නව වෙළඳ ගිවිසුම් හෝ සෘජු අලෙවිකරණ උපාය මාර්ගයන් මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(v) වතු ආශ්‍රිතව 'තේ සංචාරක කලාප' ප්‍රකාශයට පත් කිරීම මඟින් අතිරේක විදේශ විනිමය ඉපයීමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යයනයක් සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2400/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ වනවිට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) මෙම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා මෙම වර්ෂයේ වෙන් කර ඇති ප්‍රතිපාදන, එක් එක් ස්ථානය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2516/2026

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේ 'දිට්වා' ආපදා තත්ත්වයේදී ඔප්පු නොමැතිකම නිසා හෝ අනවසර පදිංචිය හේතුවෙන් නිවාස හානි වන්දි නොලැබුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එහිදී අනවසර නිවාස සහ ඔප්පු නොමැති නිවාස ලෙස සලකා බැලූ නිර්ණායක කවරේද;

(iii) ආපදාවෙන් පසු නිවාස පිරිසිදු කර ගැනීමේ කටයුතු සඳහා රුපියල් 25,000 ක් සහ පදිංචියට යාමට අත්‍යවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීම සඳහා රුපියල් 50,000 ක් ලබාදී ඇතත්, අනවසර නිවාස පදනම හා ඔප්පු නැති පදනම මත හානිවූ නිවාස සඳහා මෙම වන්දි ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 504A බැලගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හංසගම ජන උදාන ගම්මානයේ නිවාස 52 අනවසර නිවාස ලෙස හඳුනාගෙන තිබේද;

(ii) එම නිවාස 52 අතරින් නිවාස හානි වන්දි ලබාදී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ලබා නොදුන් නිවාස සඳහා වන්දි ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 4/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු නීතිඥ භේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්ට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු නීතිඥ භේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මූදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මූදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. නිස්බුල්ලාහ් මහතා,— ''ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල'' නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා ''බයිතුල්මාල්'' නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ''ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල'' නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ දී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන්

මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථීර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය සහ උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථීර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථීර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථීර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේ දී සහ සවස් කාලයේ දී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය සහ මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම

වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වනවිට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30% කින් වැඩි කිරීමටත්, ඉන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍යතාව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තීව්, නයිනතීව්, එලුවයිතීව් සහ අනලයිතීව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති

හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන්වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, ''ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය'' බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයවන්දමූර්ති මහතා,— තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මඟින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම,— පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සිදුකරන පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් දූෂිත තත්ත්වයට පත්වී තිබෙන බැවින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරීන් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 109/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම,— වසර 26 කට වැඩි කාලයක් පුරා පැවැති උතුරු නැගෙනහිර යුද්ධය නිසා සිදු වූ ජීවිත හානි, අතුරුදහන්වීම් සහ අනෙකුත් විනාශයන් සොයා බැලීම සඳහා ද, ජාතික සමඟිය ඇති කිරීම සහ ඒ වෙනුවෙන් ගත හැකි ඉදිරි පියවර සොයා බැලීම සඳහා ද වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් (Truth Commission) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 110/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීම,— අධික සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ළමුන් අතර මානසික පීඩනය සහ ආතතිය වැඩිවීම, අධ්‍යාපන කාර්ය සාධනය පහළ යාම, සයිබර් හිංසන (cyberbullying), අශෝභන හා අනාරක්ෂිත අන්තර්ගතයන්ට නිරාවරණය වීම වැනි ගැටලු වැඩිවෙමින් පවතින හෙයින් ද, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය හා ඩෙන්මාර්ක් වැනි දියුණු රටවල් මේ වනවිටත් ළමුන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය සීමා කිරීමට නීති හඳුන්වා දී තිබෙන හෙයින් ද, ළමුන්ගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ අධ්‍යාපනමය වර්ධනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් විවෘත කිරීම සඳහා අවම වයස අවුරුදු 15 ලෙස නියම කිරීම, සමාජ මාධ්‍ය සමාගම් සඳහා වයස් සත්‍යාපන ක්‍රම අනිවාර්ය කිරීම, නීතිය උල්ලංඝනය කරන ආයතන සඳහා දඩ සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ වැඩිහිටියන්ගේ ගිණුම් භාවිතා කරමින් සමාජ මාධ්‍ය භාවිතා කරන දරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 112/2026

ගරු ඝානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීම,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වසර 40 කට වැඩි කාලයක් තිස්සේ දිගු කාලීන අත්තනෝමතික රඳවා තබා ගැනීම්වලට ඉඩ සලසා ඇති හෙයින් ද, වධහිංසා මඟින් ව්‍යාජ පාපොච්ඡාරණ ලබා ගැනීම සඳහා සහ සුළු ජන කොටියාස සහ සිවිල් සමාජ කණ්ඩායම් ඉලක්ක කර ගැනීමට භාවිතා වී ඇති හෙයින් ද, අත්‍යවශ්‍යම මොහොතක දී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හැකියාව පවතින හෙයින් ද, ත්‍රස්තවාදයට සම්බන්ධ වැරදි සඳහා දැනටමත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරීමට හැකියාව පවතින හෙයින් ද, පුළුල් බලතල සහිත ස්ථිර ත්‍රස්ත විරෝධී නීතියක් සඳහා කිසිදු සාධාරණීකරණයක් නොමැති බැවින් ද, ශ්‍රී ලංකා රජය විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, එම පනතට සමාන නීතිමය විධිවිධාන අඩංගු නීතියක් හඳුන්වා දීමකින් තොරව, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 114/2026

ගරු රවී කරුණානායක මහතා, — ලෝක පරිසරය සුරැකීම, — ලෝක පරිසරය සුරැකීම කෙරෙහි ශ්‍රී ලංකාව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, විශේෂයෙන්ම ගෝලීය උණුසුම ඉහළ යාම වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 115/2026

ගරු රවී කරුණානායක මහතා,— මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම,— ලියාපදිංචි මූල්‍ය සමාගම් තුළ මුදල් තැන්පත් කර මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ට එම මුදල් නැවත ගෙවීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු බවත්, එකී සමාගම් තුළ මුදල් තැන්පත් කර වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින්, එකී සමාගම්වල භාරකාර ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව මෙහිදී කාර්යක්ෂමව ක්‍රියා කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 116/2026

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ රෝහල් පද්ධතිය තුළ බාහිර රෝගී අංශවල පවතින තදබදය අවම කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— ලෝක සෞඛ්‍ය දර්ශකයේ අප රටෙහි ස්ථානය කුමක් වුව ද, රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර ඒකකයන් හි පවතින දැඩි තදබදය පාලනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 117/2026

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අලි-මිනිස් ගැටුම බහුලව පවතින ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— සංඛ්‍යා දත්ත වාර්තාවලට අනුව අලි-මිනිස් ගැටුම ඉහළින්ම පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මේ වනවිට පත්ව ඇති හෙයින් ද, ඒ හේතුවෙන් වාර්ෂිකව මිනිසුන් හා අලි ඇතුන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත අහිමි වන හෙයින් ද, දේපළ ඇතුළු භෞතික සම්පත් විනාශ වන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස කෙන්යාව වැනි රටවල ක්‍රියාත්මක වන පරිදි, අලි-මිනිස් ගැටුම සිදුවන ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 119/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ සෙසු දිස්ත්‍රික්කවල සේවය කරන යාපනය දිස්ත්‍රික්කයට අයත් ගුරුවරුන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ යහපත පිණිස විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති ඇති කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ සිට කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අනුයුක්තව බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන රාජ්‍ය නිලධාරීන්ගේ සහ ගුරුවරුන්ගේ ප්‍රවාහන අපහසුතා සහ නවාතැන් ගැටලුවලට ස්ථීර විසඳුමක් ලබාදීම සහ ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීම සහතික කිරීම සඳහා, ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රීය ප්‍රදේශයක හෝ උචිත ස්ථානයක සියලු පහසුකම්වලින් සමන්විත විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති රජය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 120/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කාර්යක්ෂමව පරිහරණය කිරීමට සහ මුහුදු ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීමට මුලතිව් දිස්ත්‍රික්කය තුළ සාගර විශ්වවිද්‍යාලයක් (Ocean University) ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාව වටා ඇති ගැඹුරු මුහුදු සහ වෙරළාසන්න සාගර සම්පත් විද්‍යාත්මකව හා තාක්ෂණිකව මෙහෙයවීමට අවශ්‍ය මානව සම්පත නිර්මාණය කිරීම මඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි හෙයින්, උතුරු පළාතේ ඉහළ සාගර විභවතාවක් සහිත මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාවගේ

ජීවනෝපාය නවීකරණය කිරීමටත්, තරුණ තරුණියන්ට සාගර ඉංජිනේරු විද්‍යාව, සාගර ගවේෂණය සහ ජලජ සම්පත් කළමනාකරණය වැනි ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමටත්, සියලු පහසුකම්වලින් සමන්විත සාගර විශ්වවිද්‍යාලයක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 121/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ දූපත් ආශ්‍රිත ප්‍රදේශවල සහ වෙරළාසන්න ගම්මානවල පවතින දැඩි පානීය ජල හිඟයට ස්ථිර විසඳුමක් ලෙස මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති (Desalination Plants) පුළුල් කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල භූගත ජලය, කිවුල් ජලය බවට පරිවර්තනය වෙමින් පවතින හෙයින් ද, විශේෂයෙන්ම වේලනෙයි සහ නාගදීපය වැනි දූපත් ප්‍රදේශවල ජනතාව පානීය ජලය ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන හෙයින් ද, නාගදීපය වැනි ප්‍රදේශවල දැනටමත් පවතින ජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීමත්, කුරිකට්ටුවාන් හරහා නළ මාර්ගයෙන් ජලය සැපයීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීමත් මඟින් ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය මෙම ප්‍රදේශවල ජනතාවට ද ලබා දීම සහතික කිරීම සඳහා මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 122/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තරුණයින් අතර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත් ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ නවීන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම,— උතුරු පළාතේ මෑතක සිට ඉහළ ගොස් ඇති මත්ද්‍රව්‍ය ජාවාරම හා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමාජ පද්ධතිය බිඳවැටීම සහ පාසල් සිසුන්ගේ අනාගතයට බලපෑම් එල්ල වන හෙයින්, මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය මැඩලීම සඳහා ආරක්ෂක අංශ සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැටලීම් වැඩි කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමටත්, මත්ද්‍රව්‍යවලට ගොදුරු වූ තරුණයින් යහමඟට ගැනීම සඳහා උතුරු පළාත තුළ සියලු පහසුකම් සහිත රජයේ පුනරුත්ථාපන සහ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 123/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තල් සහ පොල් මූලික කරගත් අපනයන කර්මාන්තශාලා ස්ථාපනය කර රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම,— උතුරු පළාතේ බහුලව පවතින තල් සහ පොල් හුදෙක් අමුද්‍රව්‍ය ලෙස පමණක් භාවිතා නොකර, නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන නිපදවන අපනයන කර්මාන්තශාලා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීමටත්, එමඟින් එම ප්‍රදේශවල රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහ උපාධිධාරීන්ගේ ජීවනෝපාය මාර්ග සුරක්ෂිත කිරීමටත් රජය සැලසුම් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 124/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ ආරක්ෂක හමුදා භාරයේ ඇති මහජනතාවගේ ඉඩම් නිදහස් කිරීම සහ කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීම,— යුද්ධයෙන් පසුව සිදුකෙරුණු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී, මහජනතාවගේ ඉඩම් මෙතෙක් මුළුමනින්ම නිදහස් කර නොමැති හෙයින් ද, ඒ හේතුවෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතුවල සහ ධීවර කර්මාන්තයේ

නිරතවීමේ අවස්ථා අහිමි වී ඇති හෙයින් ද, මෙතෙක් නිදහස් කර නොමැති මහජනතාවගේ ඉතිරි ඉඩම්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි කඩිනමින් නිදහස් කිරීමටත්, මහජනතාවගේ ජීවනෝපාය මාර්ග යළි නගාසිටුවීම සඳහා කෘෂිකාර්මික හා ධීවර කටයුතු වෙනුවෙන් එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 128/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගුරු හිඟය සහ ඩිජිටල් අධ්‍යාපන ගැටලු සඳහා විසඳුම් ලබා දීම,— වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා වූ ගුරු පුරප්පාඩු දිස්ත්‍රික් මට්ටමේ පත්වීම් තුළින් පිරවීමටත්, එම ප්‍රදේශවල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා නවීන පරිගණක විද්‍යාගාර සහ විධිමත් අන්තර්ජාල පහසුකම් ලබා දීමටත් සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්වල සිසුන්හට අමතර අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා විශේෂ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමටත් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 129/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම,— උණ, වේවැල්, පන් හා කිතුල් ආදී ශාකවල කඳන්, ව්‍යාජ කඳන් හා පත්‍ර ප්‍රයෝජනයට ගනිමින් සිදුකරනු ලබන සාම්ප්‍රදායික කර්මාන්ත මඟින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා සංචාරක ක්ෂේත්‍රයන් සඳහා විශේෂ දායකත්වයක් ලබා දිය හැකි හෙයින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ හා සංචාරක ක්ෂේත්‍රයේ වර්තමාන පිබිදීමට සමගාමීව එකී සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමටත්, එම නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ වර්ධනය කිරීමටත්, ඒ සඳහා නිල පිළිගැනීමක් ලබා දීමටත්, මහා පරිමාණ කර්මාන්ත ඇති කිරීම සඳහා එම වගාවන් ප්‍රවර්ධනය කිරීමටත්, ඒ සඳහා ව්‍යවසායකයන් දිරිමත් කිරීමටත්, එම ශිල්පීන්ගේ ශ්‍රමයට හා කුසලතාවන්ට ඉහල වටිනාකමක් ලබා දීමටත් සහ ඔවුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමටත් අවශ්‍ය මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 130/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— මැදපෙරදිග කලාපයේ මේ වනවිට උද්ගත වී ඇති වාතාවරණය මත ඉන්ධන මිල ඉහළ යෑමේ තත්ත්වය හමුවේ මහජනයා විශාල වශයෙන් පොදු ප්‍රවාහන සේවා වෙත නැඹුරු වීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන හෙයින් ද, දිනපතා විශාල පිරිසක් රාජකාරි හෝ ව්‍යාපාරික අවශ්‍යතාවයන් සඳහා පුත්තලම මාර්ගයේ ගමන් ගන්නා හෙයින් ද, එම මගී ජනතාවට ප්‍රමාණවත් සේවාවක් ලබා දීම සඳහා පුත්තලම-කොළඹ අතර දුම්රිය ධාවනය ඉහළ දැමීමට වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 131/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පොදු ස්ථාන සහ රාජ්‍ය ආයතනවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම,— විදුලියෙන් පමණක් ක්‍රියා කරන යතුරු පැදි සහ වාහන භාවිතය මේ වනවිට ජනතාව අතර

ප්‍රචලිතව ඇති හෙයින් ද, එය පරිසර දූෂණය අවම කිරීමට ඉතාමත් වැදගත් පියවරක් වන හෙයින් ද, එය වර්තමානයේ පවත්නා අධික ඉන්ධන පරිභෝජනයට විසඳුමක් මෙන්ම ඉන්ධන සඳහා වැය වන අධික පිරිවැයට සාධාරණ විසඳුමක් වන හෙයින් ද, විදුලි යතුරු පැදි සහ වාහන භාවිතය හේතුවෙන් විදුලි පරිභෝජනය ඉහළ යා හැකි හෙයින් ද, යම් විදුලි කප්පාදුවක් ඇති වුවහොත් ඒවා භාවිතා කරන ජනතාව උග්‍ර පීඩාවකට ලක්වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති හෙයින් ද, විදුලි යතුරු පැදි සහ වාහන භාවිතා කරන ජනතාවට සහනයක් ලබා දීමට මෙන්ම විදුලි යතුරු පැදි සහ වාහන මඟින් දුර ගමන් යන ජනතාවගේ යතුරු පැදි සහ වාහනවල බැටරිය ආරෝපණය කර ගැනීමේ පහසුව සඳහා පොදු ස්ථානවල සහ රාජ්‍ය ආයතන පරිශ්‍රවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක (Solar Charging Points) සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 133/2026

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— පදිකයන්ට සෙවණ සැපයීම, පරිසරයේ සුන්දරත්වය සහ හරිත ආවරණය වැඩිදියුණු කිරීම, වාහනවලින් නිකුත් වන දූෂක වායු අවශෝෂණය කිරීම මෙන්ම නාගරික ප්‍රදේශවල ජෛව කොරිඩෝ (bio corridors) ලෙස ක්‍රියා කිරීම උදෙසා මාර්ග රක්ෂිතයන්හි ඇති ගස් මඟින් සුවිශාල මෙහෙවරක් ඉටු කෙරෙන හෙයින් ද, ශ්‍රී ලංකාවේ මාර්ග රක්ෂිතයන්හි ගස් වෘත්තීයමය ආකාරයෙන් (arborists මඟින්) කළමනාකරණය නොකෙරෙන හෙයින් ද, විදුලිබලය සපයන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA), පළාත් පාලන ආයතන සහ ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතනවල සේවකයන් මඟින් විදුලි රැහැන් හා මාර්ග සංඥා ආවරණය වන අතු පමණක් කපා ඉවත් කිරීමේ අක්‍රමවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන හෙයින් ද, පරිසර සුන්දරත්වය රැකෙන පරිදි මාර්ග රක්ෂිත ප්‍රමාණයන් නිසි ලෙස නිර්ණය කිරීම, අදාළ ආයතනවල සේවකයන් පුහුණු කරමින් ශාක වියන් නඩත්තු කිරීම සහ මාර්ග රක්ෂිතවල ගස් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් සිදුවන අනතුරු හා ව්‍යසන වළක්වා ගත හැකි විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 134/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— 1988/90 කාලසීමාවේ සිදු වූ සිවිල් යුධමය තත්ත්වය සහ එවැනි තත්ත්වයක් නැවත ඇති වීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම,— 1988/90 කාලසීමාවේ ශ්‍රී ලංකාවේ සිදු වූ ජනතා විමුක්ති පෙරමුණ මූලික කරගත් සිවිල් යුධමය තත්ත්වය තුළ ඇති වූ විනාශයේ, ආර්ථිකමය වටිනාකම සහ සත්‍ය වශයෙන්ම එම තත්ත්වයට හේතු වූ සිදුවීම පිටුපස තිබූ තරුණ නැගිටීම, එහි දේශපාලන මතවාදයන් මෙන්ම, එවැනි තත්ත්වයක් නැවත ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මනා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2026 නොවැම්බර් 13 සිකුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1002/2025

ගරු මුජීබුර් රහුමාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට අපද්‍රව්‍ය බැහැර කෙරෙන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(iii) දිනකට එම ස්ථානය වෙත බැහැර කෙරෙන කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වය හේතුවෙන් කරදියාන ප්‍රදේශය අවට ජීවත් වන පවුල් විශාල සංඛ්‍යාවක් දැඩි දුෂ්කරතාවලට මුහුණදී සිටින බව දන්නේද;

(v) කැලිකසළ කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට යැවීම වෙනුවට ඒ සඳහා විධිමත් වැඩසටහනක් සකස් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධ්‍යාපන විද්‍යාපීඨවල දැනට සේවය කරනු ලබන ගුරු අධ්‍යාපනඥයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු අධ්‍යාපනඥයින් සැලකිය යුතු සංඛ්‍යාවක් ස්ථාන මාරුවීම් නොලබා එකම ආයතනයේ දීර්ඝ කාලයක් සේවය කරන බව දන්නේද;

(iv) එම ආයතනවල සේවය කරන ගුරු අධ්‍යාපනඥයින් සඳහා ක්‍රමානුකූල ස්ථාන මාරු ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක වන්නේද;

(v) නොඑසේ නම්, ගුරු අධ්‍යාපනඥයින් වෙනුවෙන් සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා රජය ක්‍රියාත්මක කිරීමට අදහස් කරන පියවර හෝ සැලසුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1340/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කලපු සංරක්ෂණ සහ කළමනාකරණ වැඩසටහනේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා තෝරා ගෙන ඇති කලපු කවරේද;

(iv) ධීවර කර්මාන්තය සඳහා කලපු සංරක්ෂණය සහ සංවර්ධනය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1379/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ ව්‍යාත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට දිවයින පුරා පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු-නැගෙනහිර පළාත්වල තොරතුරු තාක්ෂණ, ගෘහ ආර්ථික විද්‍යාව සහ සෞන්දර්ය විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්, මේ වනවිට ගුරු සේවයට බඳවා ගෙන ඇති ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ගුරු සේවයට බඳවාගැනීමේදී රජය විසින් පිළිගනු ලබන ඩිප්ලෝමාවන් ප්‍රදානය කරන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1534/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පළාත් 09 තුළ ක්‍රියාත්මක වන මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි මහින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර නිකුත් කිරීම මඟින් එක් එක් අධිකාරිය විසින් වාර්ෂිකව උපයා ඇති ආදායම පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී වංචා සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 14 සෙනසුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1196/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පාසල්වල භෞතික සම්පත් ඌනතාවයක් සහ කාර්ය මණ්ඩල පුරප්පාඩු ඇති බව දන්නේද;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි යා/ඩෙල්ෆ්ට් රෝමානු කතෝලික බාලිකා විද්‍යාලය අයත් වන පාසල් කාණ්ඩය කවරේද;

(iii) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පාසලේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පවතින පුරප්පාඩු මෙතෙක් සම්පූර්ණ නොකිරීමට හේතු කවරේද;

(vi) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කොපමණද;

(vii) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ අධ්‍යාපන කටයුතු සඳහා එල්ලවී ඇති බලපෑම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1507/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ පාසල්වල මේ වනවිට ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සේවය කරනු ලබන ගුරුවරුන්ගේ විස්තර සහ ඔවුන්ගේ සේවා කාලය පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන්ට ගුරු සහායකයින් ලෙස පත්වීම් ලබාදීම සඳහා අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1529/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ පාසල් සඳහා අනුමත, මේ වනවිට සේවයේ නියුතු, අතිරික්ත සහ පුරප්පාඩුවී පවතින අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කලාපය අනුව;

(ii) අනුමත කාර්ය මණ්ඩල වෙන්කිරීම් අනුව රාත්‍රී මුරකරුවන් නොමැති පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 05 තුළ දිවයිනේ පාසල්වලින් වාර්තාවී ඇති ඉලෙක්ට්‍රොනික උපකරණ සොරකම් සිද්ධීන් පිළිබඳ තොරතුරු තිබේද;

(ii) පාසල්වල ඇති තොරතුරු තාක්ෂණ උපකරණවල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම උපකරණවල ආරක්ෂාව සඳහා රාත්‍රී මුරකරුවන් යෙදවීම හෝ විකල්ප ආරක්ෂිත ක්‍රියාමාර්ග සඳහා 2026 අයවැයෙන් විශේෂ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ඩිජිටල් අධ්‍යාපන වැඩසටහන් ප්‍රමාණවත් ආරක්ෂාවක් සහ අඛණ්ඩ නඩත්තු කටයුතු සමඟ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1836/2026

ගරු චානක මාදුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී රජයේ පාසල් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීමේදී ජාතික ශිෂ්‍යභට බලකා කාණ්ඩයෙන් 5%ක කොටසක් බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එලෙස බඳවාගැනීමේ අරමුණු කවරේද;

(iii) බඳවාගත් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ සේවය පාසල් ශිෂ්‍යභට කටයුතු සඳහා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iv) ඉදිරියේදී ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරි නිලධාරින් ලෙස කටයුතු කිරීම සඳහා එම ක්‍රීඩා පුහුණුකරුවන්ට අවස්ථාව ලබාදීමට කටයුතු කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා ඇති බාධා හෝ සීමා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1944/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ගැටුම් පැවති සමයේ සහ ඉන් අනතුරුව අත්අඩංගුවට ගත් හෝ භාරවූ පුද්ගලයන් පැවති රජය විසින් පුනරුත්ථාපනය කර ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පුනරුත්ථාපනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සඳහා ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩසටහන් කවරේද;

(iv) පුනරුත්ථාපනය කළ සියලු දෙනා නිදහස් කර තිබේද;

(v) එම පුද්ගලයන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වෘත්තීය පුහුණුව ලබාදී තිබේද;

(vi) එසේ නම්, පුහුණුවට අදාළ උපකරණ හෝ වෙනත් ආධාර ලබාදී තිබේද;

(vii) එම පුද්ගලයන්ගේ ජීවනෝපාය ශක්තිමත් කිරීම සඳහා ණය හෝ වෙනත් මූල්‍ය ආධාර ක්‍රම ක්‍රියාත්මක කර තිබේද;

(viii) නොඑසේ නම්, එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 16 සඳුදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1685/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති අධිකරණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධිකරණවල නම් කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන සංචාරක අධිකරණ කවරේද;

(iv) එම අධිකරණ කොපමණ කාලයක සිට ක්‍රියාත්මක වන්නේද;

(v) එලෙස ක්‍රියාත්මක වන අධිකරණ, මහෙස්ත්‍රාත් අධිකරණ ලෙස දින 05 පුරාම ක්‍රියාත්මක කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබේද;

(vi) එසේ නම්, එම යෝජනාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කින්නියා සංචාරක අධිකරණය ස්ථිර අධිකරණයක් ලෙස ස්ථාපිත කිරීමේදී පවතින ගැටලු කවරේද;

(ii) එම ගැටලු විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රදේශයේ ස්ථිර අධිකරණයක් ස්ථාපිත කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2199/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට මෙරට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමික විදුහල්පතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුහල්පතිවරුන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විෂමතා පවතින්නේද;

(iii) එසේ නම්, එම විෂමතා නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2278/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) එම දෙපාර්තමේන්තුවේ වර්තමාන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) දෙපාර්තමේන්තුව මඟින් දිළිඳු ජනතාව සඳහා ආධාර ලබාදෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේද;

(iv) දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය කවරේද;

(v) එම කාර්යභාරය ඉටුකිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2296/2026

ගරු සුරංග රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ලේඛන අනුව මේ දක්වා ලියාපදිංචි කර ඇති මුළු වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් රක්ෂිතයේ, පාමුල හෝ ආරක්ෂිත කලාපය තුළ අනවසරයෙන් ඉදිකර ඇති ව්‍යාපාරික ස්ථාන සහ පදිංචි නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉවත් කර ඇති සහ තවදුරටත් ඉවත් කිරීමට නියමිත අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉවත් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

(iii) අනවසර ඉදිකිරීම් ඉවත් කර අදාළ වැව් රක්ෂිත ප්‍රදේශ නීත්‍යානුකූලව සංරක්ෂණය කිරීම සඳහා රජය හෝ අදාළ ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2485/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 'රණවිරු ගම්මාන' සංඛ්‍යාව, ඒවා පිහිටි දිස්ත්‍රික්ක සහ එක් එක් ගම්මානයට වෙන් කළ ඉඩම් ප්‍රමාණය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රණවිරු ගම්මාන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ ක්‍රමවේදය සහ නිර්ණායක කවරේද;

(ii) එම ගම්මාන පිහිටුවීම සහ ඉඩම් ප්‍රදානය සඳහා සම්බන්ධ වන රාජ්‍ය ආයතන සහ ඒවායේ කාර්යභාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ඉඩම් හෝ නිවාස වෙනත් පාර්ශ්වයකට විකිණීම, පැවරීම හෝ බදු දීම සම්බන්ධයෙන් සීමාවන් පනවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රණවිරුවන්ට ප්‍රදානය කරනු ලබන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම ගම්මානවල සනීපාරක්ෂාව සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සපයා තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ගම්මානවල නිවාසවල තත්ත්වය, ප්‍රමාණයන් සහ යටිතල පහසුකම් සම්බන්ධයෙන් අවසන් වරට නිල ඇගයීමක් සිදු කළ දිනය, හඳුනාගත් අඩුපාඩු සහ ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(v) ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය, නඩත්තු කිරීම සහ ප්‍රතිලාභීන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 17 අඟහරුවාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

35/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අරමුදල් මඟින් චිත්‍රපටි නිෂ්පාදනය සඳහා ලබාදී ඇති මුළු ණය මුදල කොපමණද;

(ii) එම ණය ලබාගත් චිත්‍රපටි නිෂ්පාදකයන්ගේ නම් සහ එක් එක් නිෂ්පාදකයන්ට ලබාදී ඇති ණය මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් කාලසීමාව තුළ ලබාදී ඇති ණය අතරින් මෙතෙක් අය කරගෙන නොමැති ණය මුදල කොපමණද;

(iv) එම හිඟ ණය අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2178/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති මේ වනවිට ලියාපදිංචි කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරාවිද්‍යා ස්ථාන කවරේද;

(iii) මෙම පුරාවිද්‍යා ස්ථාන අයත් වන පුරාවිද්‍යා කලාප කවරේද;

(iv) එම එක් එක් කලාපය සතු භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම කලාප තුළ පිහිටි පුරාවිද්‍යා ස්ථාන අතරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සංරක්ෂණය කර ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කර ඇති ස්ථාන අතරින් දේශීය සහ විදේශීය සංචාරකයින් සඳහා නැරඹීමට විවෘත කර ඇති ස්ථාන කවරේද:

(ii) එම ස්ථාන නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම්, ප්‍රවේශ මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2206/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුවලට මුහුණ පා සිටින ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) මෙම ගම්මානවල පානීය ජල ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2270/2026

ගරු රුවන් මාපලගම මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර ඇති රජයේ නිවාස ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් නිවාස ව්‍යාපෘතියේ ආරම්භ කළ වර්ෂය, ජනතා අයිතියට පත් කළ වර්ෂය, භූමි ප්‍රමාණය සහ මේ වනවිට පවතින නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිට්ටඹුව, රන් පොකුණුගම නිවාස සංකීර්ණය තුළ ක්‍රියාත්මක කර ඇති ‘රනිඳුගම’ සහ ‘ගුරු ගම්මානය’ නිවාස ව්‍යාපෘති සඳහා නිවාසලාභීන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘති දෙකෙහි පිහිටි නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ව්‍යාපෘති යටතේ එක් නිවාස ඒකකයක් සඳහා රජය විසින් ලබාදී ඇති ආධාර/ණය මුදල කොපමණද;

(iv) එම නිවාසලාභීන්ට ඔවුන් පදිංචිව සිටින ඉඩම්වල අයිතිය පැවරීම සඳහා ගෙවිය යුතු මුදල තීරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2511/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) විශාල වපසරියකින් යුත් සෙවනගල ප්‍රදේශයට, ප්‍රාදේශීය සභාවක් නොමැති වීම හේතුවෙන් එය දැනට තණමල්විල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් වන බව දන්නේද;

(iv) එසේ නම්, සෙවනගල සඳහා ප්‍රාදේශීය සභාවක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(v) ගල්ගමුව, නෙල්ලියද්ද, මුල්ලේගම හා ඉහිණියාගල යන ග්‍රාම නිලධාරී කොට්ඨාස 04 මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන බව දන්නේද;

(vi) එම කොට්ඨාසවල ජනතාවට බිබිල හා මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පසුකර කිලෝමීටර් 90ක පමණ දුරක් ගෙවා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යාමට සිදුවන බැවින්, එම අපහසුතාව මහ හරවා ගැනීම සඳහා එම කොට්ඨාස බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පවරා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 18 බදාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

165/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් ගුවන් සේවය රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතනය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමට ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) පසුගිය රජය සමයේ ශ්‍රී ලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට ගත් තීරණය සම්බන්ධව වර්තමාන රජයේ ස්ථාවරය කවරේද;

(iv) රටේ බදු ගෙවන ජනතාවට බරක් නොවන පරිදි මෙම ආයතනය පවත්වාගෙන යෑම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

689/2025

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාව යටතේ ක්‍රියාත්මක වන අංශ සහ දෙපාර්තමේන්තු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අංශ සහ දෙපාර්තමේන්තුවල නම් කවරේද;

(iii) මේ වනවිට මෙම එක් එක් අංශයේ සේවයේ නියුතු ස්ථීර, අනියම් සහ කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තු සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සේවක හිඟය කොළඹ මහ නගර සභාවේ කටයුතුවලට බාධාවක් වන බැවින්, එම තත්ත්වය නිවැරදි කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2046/2026

ගරු ඝානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොහෝ ප්‍රදේශවල පාරම්පරික වෛද්‍ය ක්‍රම මඟින් සපයන වැඩිහිටි සත්කාරක සේවා ස්ථාන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩිහිටියන්ට දුරබැහැර ප්‍රදේශවලින් ප්‍රතිකාර ලබාගැනීමට සිදුවන බව දන්නේද;

(ii) ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහන් යටතේ පාරම්පරික වෛද්‍ය සේවා සඳහා වෛද්‍යවරුන් පත්කර සේවා ලබාදීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) බෝ නොවන රෝග සඳහා දේශීය හා බටහිර වෛද්‍ය ප්‍රතිකාර ඒකාබද්ධව ලබාදීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(iv) බෝ නොවන රෝග, මස්තිෂ්ක අංශභාගය, ඩවුන් සින්ඩ්‍රෝමය, පාකින්සන් රෝගය, දියවැඩියාව සහ පිළිකා වැනි බරපතළ රෝග සඳහා ඇතැම් දේශීය වෛද්‍ය රෝහල්වල ලබාදෙන ප්‍රතිකාර සේවා දිස්ත්‍රික්ක 25 තුළම ව්‍යාප්ත කිරීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය වෛද්‍ය සේවයේ සීමාවාසික පුහුණුව අවසන්වූ සැණින් වෛද්‍යවරුන්ට 'නේවාසික ගෘහ වෛද්‍ය නිලධාරීන්' ලෙස සේවයේ යෙදීමට අවස්ථාව ලබා නොදීමට හේතු කවරේද;

(ii) විරැකියාවෙන් සිටින දේශීය වෛද්‍යවරුන් සඳහා ඉදිරියේදී රැකියා අවස්ථා සලසා දීම සඳහා අමාත්‍යාංශය සතුව සැලසුම් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2107/2026

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උඩවලව ජාතික වනෝද්‍යානය සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය අතර පිහිටි අලි කොරිඩෝව ගැසට් කරන ලද දිනය කවරේද;

(ii) කොරිඩෝව දෙපස ආරක්ෂිත විදුලි වැට ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(iii) මෙම විදුලි වැට ඉදිකිරීමේ මූලික අරමුණ කවරේද;

(iv) අලි වැට ඉදිකිරීම සඳහා දරා ඇති මුළු පිරිවැය කොපමණද;

(v) 2018 වර්ෂයේදී අලිවැට තිබියදීත් උදැසන කාලයේ ගම්වැදුණු අලියෙකු විසින් පාසල් දරුවෙකු මරණයට පත් කළ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි කොරිඩෝව දෙපස ස්ථාපනය කර ඇති විදුලි වැටෙහි බලහරුව ගම්මානය ආවරණය වන කොටසෙහි ප්‍රධාන විදුලි වැට මේ වනවිට අක්‍රියව පවතින බව දන්නේද;

(ii) එම විදුලි වැට ඉවත් කිරීම සඳහා තීරණයක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එම තීරණය ගත් දිනය සහ අරමුණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2545/2026

ගරු නිශාන්ත පෙරේරා මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1977 වර්ෂයෙන් පසු ආදර්ශ ගම්මාන යටතේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ නිවාස ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම ගම්මාන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිවාස ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 19 බ්‍රහස්පතින්දා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

982/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය අලෙවියෙන් උපයන ලද මුළු ආදායම කොපමණද;

(ii) එම වර්ෂය තුළ එම මණ්ඩලය විසින් දරන ලද සමස්ත වියදම කොපමණද;

(iii) 2025 ජනවාරි මාසය වනවිට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවූ සාමාන්‍ය පිරිවැය කොපමණද;

(iv) 2023, 2024 සහ 2025 වර්ෂවල මණ්ඩලය විසින් ලැබූ ලාභය/අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2025 වර්ෂය තුළ මණ්ඩලය පාඩු ලැබුවේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vi) එම කාලසීමාව තුළ විදුලි ගාස්තු සංශෝධනය කළ වාර සංඛ්‍යාව කොපමණද;

(vii) 2023 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරය විසින් ලබාදී ඇති මුදල් ප්‍රමාණ සහ ඒවා ලබා දුන් දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

990/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පවත්වා ඇති 'වන ඝනත්වය' සම්බන්ධ සංගණන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංගණනයන් සිදු කළ වර්ෂ කවරේද;

(iii) එම එක් එක් සංගණනයේදී ශ්‍රී ලංකාවේ 'වන ඝනත්වය' දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා 'වන ඝනත්වය' ආරක්ෂා කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1671/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා පොස්පේට් සමාගම යටතේ පවතින එප්පාවල පොස්පේට් ආයතනය සතුව අංක KQ 4329 දරන වාහනයක් තිබෙන බවත්;

(ii) එම වාහනය පොස්පේට් සමාගමේ සභාපතිවරයා විසින් පදවාගෙන යන අතරතුර අනතුරකට ලක්වූ බවත්;

(iii) මේ වනවිට එම වාහනය රක්ෂණ සමාගම විසින් භාවිතයට නුසුදුසු බවට (condemned) නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාහනය භාවිතා කිරීම සඳහා සභාපතිවරයාට අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය ලබාදී තිබුණේද;

(ii) එම වාහනයට සිදුවූ අලාභය රක්ෂණ සමාගම මඟින් ආවරණය කර ගනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, සභාපතිවරයාගෙන් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2458/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය හරස් මාර්ග ආරක්ෂා කිරීම සඳහා මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම එක් එක් ක්‍රමය අනුව ආරක්ෂා කර ඇති දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දුම්රිය හරස් මාර්ග ආරක්ෂක පද්ධති අතරින් නිසි පරිදි ක්‍රියාත්මක නොවන සීනු හා සංඥා පද්ධති සංඛ්‍යාව කොපමණද;

(v) එම සංඥා පද්ධති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) දුම්රිය හරස් මාර්ග අතරින් වාර්ෂික සේවා ගාස්තු අය කරනු ලබන හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(vii) එම ගාස්තු වශයෙන් 2025 වර්ෂයේ ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ, ගාල්ල අධ්‍යාපන කලාපයට අයත් බලපිටිය අධ්‍යාපන කොට්ඨාසයේ ක්‍රියාත්මකව පවතින රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධ්‍යාපන කොට්ඨාසය තුළ විවිධ හේතු මත වසා දමා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් වසා දැමීමට බලපා ඇති හේතු කවරේද;

(iv) කොට්ඨාසය තුළ 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යටතේ පාලනය වන හෝ එම පනතට අයත් වන පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසා දමා ඇති හෝ සිසුන් නොමැතිවීම හේතුවෙන් අක්‍රියව පවතින පාසල් සතු ගොඩනැගිලි හා ඉඩම් ඇතුළු පොදු දේපළ ප්‍රජා අධ්‍යාපන කටයුතු, වෘත්තීය පුහුණුව වැනි ඵලදායී පොදු අරමුණු සඳහා යොදාගැනීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

(ii) එම රාජ්‍ය දේපළ අවභාවිත වීම වැළැක්වීමට සහ සුරක්ෂිත කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?